# ජල සම්පත් මණ්ඩලය

## පරිසර අමාත්‍යාංශය

# පුරප්පාඩු

## ජල සම්පත් මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තනතුරේ පුරප්පාඩුව පිරවීම - 2025

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පුරප්පාඩු වී පවතින සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සාමාන්‍යාධිකාරී (H M 2-1)

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර අයදුම්කරුවන් (1 හෝ 2 සුදුසුකම්)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාව/ඉංජිනේරු/ව්‍යාපාර පරිපාලන/රාජ්‍ය පරිපාලන හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ වන වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම.

   **සහ**

   විද්‍යාව/ඉංජිනේරු/ව්‍යාපාර පරිපාලන/රාජ්‍ය පරිපාලන හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ වන වෙනත් ඕනෑම පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

   **සමඟ**

   පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ්‍යමය ආයතනයක තම විෂයපථය තුළ මනා පරිචයක් සහ අවම වශයෙන් අවුරුදු 20 ක කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 5 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාව/ඉංජිනේරු/ව්‍යාපාර පරිපාලන/රාජ්‍ය පරිපාලන හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ වන වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම.

   **සහ**

   විෂය ක්ෂේත්‍රයට අදාළ වන ආචාර්ය උපාධියක් ලබා තිබීම.

   **සහ**

   ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ්‍යමය ආයතනයක තම විෂය පථය තුළ මනා පරිචයක් සහ අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 5 ක කළමනාකරණ පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

ජල සම්පත් මණ්ඩලය තුළ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (එච් එම් 1-3) තනතුරේ වසර 2 ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ සහකාර සාමාන්‍යාධිකාරී (එච් එම් 1-1) තනතුරේ වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

බහුවිධ ක්ෂේත්‍ර කණ්ඩායම් වලට නායකත්වය දීමට හා මෙහෙයවීමට හැකියාවක් ලබා තිබීම. මානව සම්පත් හා අනෙකුත් සම්පත් නිසි ආකාරව සහ කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍ය පළපුරුද්ද ලබා තිබීම.

**වයස් සීමාවන් :** බාහිර අයදුම්කරුවන් සඳහා අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 නොඉක්මා විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ.

**පොදු කොන්දේසි :**

1. අයදුම්කරුවන් ඉහත සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට ප්‍රථම සම්පූර්ණ කළ යුතුය.
2. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
3. වැටුප් ගෙවීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක MSD 01 / 2025 අදාළ වේ.
4. රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව, වෘත්තීය දීමනාව, ප්‍රවාහන දීමනාව හෝ ප්‍රවාහන පහසුකම් හා ඉන්ධන දීමනාව සමඟ අනෙකුත් අදාළ දීමනා ගෙවනු ලැබේ.
5. රාජ්‍ය / සංස්ථා හෝ මණ්ඩලවල අයදුම්කරුවන් සඳහා වයස් සීමාව බල නොපැවැත්වේ.
6. රජයේ හෝ රාජ්‍ය / සංස්ථා හෝ මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.
7. අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.
8. අයදුම්පත සම්පූර්ණ ජීවදත්ත සමඟ සහතිකවල පිටපත්ද සහිතව ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ **සභාපති, ජල සම්පත් මණ්ඩලය, 488/ඒ, නාවල පාර, කොස්වත්ත, රාජගිරිය** යන ලිපිනයට 2025.08.07 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

**සභාපති,**
**ජල සම්පත් මණ්ඩලය,**
**488/ඒ, නාවල පාර,**
**කොස්වත්ත, රාජගිරිය.**